**මාතලේ මහා නගර සභාව - 2020**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 අහිතකර මතය**

**------------------**

මාතලේ මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට මාතලේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

**---------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**---------------------------------------------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (ත) හා (ථ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවන ලද රු.542,396 ක ණය වාරික මුදල ණය ප්‍රාග්ධන ගිණුමට හර කිරීමකින් තොරව ණය පොලී ගිණුමට හර කර තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.32,015,580 ක් වුවත්, එය රු.25,524,210 ක් ලෙස රු.6,491,370ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ස්ථාවර තැන්පතු සහතික 63 කට අදාළ ශේෂය රු.222,902,083 ක් වුවත්, එය රු.217,050,495 ක් ලෙස රු.5,851,588 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම පිළිවෙළින් රු.20,800,472 ක් හා රු.5,523,143 ක් වුවත්, එය රු.19,703,644 ක් හා රු.3,548,360 ක් ලෙස පිළිවෙළින් රු.1,096,828 ක් හා රු.1,974,783 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ පසුගිය වර්ෂයට අදාළ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.505,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබියයුතු ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු.922,425 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු රු.201,969 ක මුද්දර බදු රු.22,816 ක් ලෙස රු.179,153 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවැති රු.353,643 ක සේවක ඇප තැන්පත් මුදල රු.136,990 ක් ලෙස රු.216,653ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (එ) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දෙන ලද එම වර්ෂයේ ගිණුම්ගත නොකළ රු.6,405,000 ක ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායමක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීම සඳහා රු.60,405,500 ක් ලෙස දෝෂ සහගතව වෙනත් ආදායම් පාලන ගිණුමට හරකර සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. පසුව සමලෝචිත වර්ෂයේදී ලැබුණු මුද්දර ගාස්තුවලින් රු.6,146,700 ක් වෙනත් ආදායම් ගිණුමට බැර කිරීමකින් තොරව දෝෂ සහගතව සමුච්චිත අරමුදල් ගිණුමට බැරකර තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ණයහිමි කරන ලද ගොඩනැගිලි තුනක අළුත්වැඩියා කටයුතු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට අවසන් කර නොතිබියදී එහි රු.9,385,941 ක් වූ එහි ඇස්තමේන්තුගත වටිනාකමක් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඔ) | අළුවිහාරේ කියවීම් ශාලාව ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ වැය කර තිබූ රු.3,065,769 ක් හා සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ රු.632,243 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 09 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඕ) | ඉකුත් වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.4,224,058 ක් එම වර්ෂයේ ගිණුම්ගත නොකිරීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී එය රු.2,245,685 ක් ලෙස ලැබිය යුතු උසාවි දඩ රු.1,978,373 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ඖ) | ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.3,253,157 ක් රු.3,400,000 ක් ලෙස ණයගැතිකර තිබීම හේතුවෙන් ණයගැතියන් රු.146,843 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙම ව්‍යාපෘති 03 සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.3,253,157 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර ද නොතිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ක) | ව්‍යාපෘති 07 කට අදාළව ඉකුත් වර්ෂවල දී ණයගැතිකර තිබුණු රු.650,752 ක් සමාලෝචිත වර්ෂය වන විට පියවාගෙන තිබුණ ද, තවදුරටත් ණයගැතියන් යටතේ ගිණුම්වල දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ජ’නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ග) | ඉකුත් වර්ෂවල දී ව්‍යාපෘති 61 කට අදාළ ණයහිමි කරන ලද රු.10,517,811 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට නිරවුල් කර තිබියදී, තවදුරටත් එම මුදල ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ජ’නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ච) | ඉකුත් වර්ෂයේ දී ණයහිමි කරන ලද එහෙත් ඉදිකිරීම් ආරම්භ නොකර අතහැර දමා තිබුණු ව්‍යාපෘති 03 ක පිරිවැය රු.3,838,643 ක් තවදුරටත් ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ජ’නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ජ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගිවිසුම්ගත වී වැඩ අවසන් කර නොතිබුණු ව්‍යාපෘති 26 ක එකතු පිරිවැය රු.32,647,154 ක්, රු.38,489,885 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ණයහිමියන් රු.5,842,731 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ජ’නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ට) | මාර්ගස්ථ තොග ගිණුමක හෝ ගැළපීම් කිරීමකින් තොරව රු.19,123,258 ක් ජ’නල් සටහනක් මගින් සැපයුම් ගැණුම් ගිණුම හර හා සැපයුම් ණයහිමි ගිණුම බැර ලෙස දක්වා තිබුණි. පසුව රු.19,123,258 ක් සැපයුම් ණයහිමි ගිණුමට බැරකර තිබුණ ද, සැපයුම් ගැණුම් ගිණුම හරකර නොතිබුණි. | 2021 වර්ෂයේ ජ’නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතු වීම. |
| (ඩ) | පසුගිය වර්ෂයේ ණයහිමියන් කපා හැරීම සඳහා අංක 13 දරන ජ’නල් සටහනෙහි රු.5,541,043 කින් සැපයුම් ණයහිමි (පාලන) ගිණුම හර හා සැපයුම් ණයහිමි ගිණුම බැර කරන බව දක්වා තිබුණද, රු.5,541,043 කින් සැපයුම් ණයහිමි ගිණුම හර කිරීම පමණක් සිදුකර තිබුණි. | 2021 වර්ෂයේ ජ’නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |
| (ත) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වර්තාවෙන් පෙන්වා දෙන ලද සමුච්චිත අරමුදලට බැර විය යුතු රු.16,673,586 ක් හර කර තිබීම හා හර කළ යුතු රු.2,372,791 ක් බැර කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ එම වටිනාකම්වල දෙගුණය වූ රු.38,092,754 ක් සමුච්චිත අරමුදලට හර හා බැර කිරීම හේතුවෙන් එම වරද නිවැරදි වී නොතිබුණි. | 2021 වර්ෂයේ ජ’නල් සටහන් මගින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඵ) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වර්තාවෙන් පෙන්වා දෙන ලද ගිණුම්ගත නොකළ රු.1,157,690 ක එකතු වියදමක් ගිණුම්ගත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ එම වටිනාකම සමුච්චිත අරමුදලට හර හා බැර කිරීම හේතුවෙන් එම වරද නිවැරදි වී නොතිබුණි. | 2021 වර්ෂයේ ජ'නල් සටහන් මඟින් නිවැරදි කරමි. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| වි ගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.3,932,509,777 ක් වුවද ඊට අදාළ අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. 3,904,241,962 ක් වූයෙන් රු. 28,267,815 ක වෙනසක් විය. | විශේෂ කමිටුවක් පත්කර නිරවුල් කිරීමට කටයුතු කරන බව හා 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළයුතු වීම. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| වි ගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 09 ක එකතුව රු. 3,764,220,473 ක ශේෂ තහවුරු කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, ලිපිගොනු හා ලේඛන හා විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාපණය කිරීමට නොහැකි විය. | විස්තරාත්මක උප ලේඛන සකස් කර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | විගණනට අවශ්‍ය සියලු සාක්ෂි ඉදිරිපත් කළයුතු වීම. |

**1.7 අනුකූල නොවීම්**

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) පාර්ලිමේන්තු පනත් | | | |
| මහා නගර සභා ආඥා පනත (252) අධිකාරය | | | |
| (i)179 (අ) (ආ) | මාතලේ නගරයේ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 60 දරන කඩ කාමරයේ බදුකරු ලෙස 2012 දෙසැම්බර් 31 දින ගිවිසුම්ගත වී තිබූ අයෙක් | සභික ධූරයකට එළඹීමට පෙර ගිවිසුම්ගතවීම් වලින් නිදහස් විය යුතු බවට පනතේ සඳහන් නොවන බැවින් හා ගිවිසුමේ සඳහන් පරිදි | මහා නගර සභා ආඥා පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2018 මාර්තු 09 දිනැති අංක 2061/42- 05 අංක දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මාතලේ මහා නගර සභාවේ සභිකයෙකු ලෙස පත්කර තිබුණි. එසේම එම කඩ කාමරය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනවන විට රු.1,296,456 ක එක්වන් මුදලක් හා රු.3,488,945 ක දඩ මුදලක් ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර කටයුතුවලින් ඉවත් වීමට නොහැකි බවයි. | |
| | (ii)229(ආ) වගන්තිය | සුපිරි වෙළඳ සංකීර්ණයේ හා ගොංහාවෙල වෙළඳ සංකීර්ණයේ පවත්වාගෙන යන එකතුව වර්ග අඩි 210ක ගව මස් අලෙවි කිරීමේ කඩ කාමර දෙකක් වාර්ෂිකව ටෙන්ඩර් කිරීමකින් තොරව පෙර බදුකරුටම වාර්ෂික කුලිය සියයට 10 ක් වැඩිකර 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 3 ක් සඳහා ලබාදී තිබුණි. | බදුකරුවන් තෝරා ගැනීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරමි. | මහා නගර සභා අඥා පනතේ සඳහන් පරිදි ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කළ යුතු වීම. |
| (ආ) | 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන ගැසට් පත්‍රයේ පළ කළ සම්මත අතුරු ව්‍යවස්ථාව<br>-------------------- | | | |
| | xx වැනි කොටසේ 9 ඡේදය | මහා නගර සභා පොදු වෙළඳපලවලට පරිභාහිර ස්ථානවල ගව මස් කඩයක්, මාළු කඩ 06 ක් හා කුකුල් මස් කඩ 24 ක් පවත්වාගෙන යමින් තිබුණි. | 2021 වර්ෂයේ බලපත්‍ර ලබාදීමේදී ඒ පිළිබඳව සලකා බලා කටයුතු කරමි. | අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------------- | | | |
| මුදල් රෙගුලාසි 396 (ඈ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 6 ක් ඉකුත් වූ රු.268,111 ක් වටිනා චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චෙක්පත්වල දින දීර්ඝ කිරීමට හා අස්ථානගත වී ඇත්නම් හිලව් චෙක්පත් නිකුත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>------------------- | | | |
| (i) 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය හා ඊට සංශෝධන ලෙස 2019 ජූනි 31 දිනැති අංක 13/2008(V) දරන චක්‍රලේඛය | හිටපු නාගරික කොමසාරිස්වරයාට මසකට ඉන්ධන ලීටර් 140 ක් සඳහා රු.14,560 ක ඉන්ධන දීමනාවක් වැටුපට එකතු කර ලබාදී තිබුණි. එසේ තිබියදී, 2020 ජනවාරි 01 සිට ජූනි 30 දක්වා කාල පරිච්ඡේදය තුළ කොමසාරිස්වරයාගේ ගමන් වෙනුවෙන් සංචිත වාහන දෙකක් සඳහා අනුමැතියකින් තොරව ඉන්ධන ලීටර් 1921 ක් රු.209,290 ක් වැයකර තිබුණි. | උපරිම ඉන්ධන සීමාව නොයික්මවන පරිදි වාහනය ධාවනය කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) වෙනත් චක්‍රලේඛ<br>-------------------- | | | |
| (i) 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5.1 ඡේදය | රජයේ තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව, සුපිරි වෙළඳ සංකීර්ණයේ මාළු කඩ 15 ක් වර්ෂ ගණනාවක සිට කුලී පදනම මත හා බදු පදනම මත බාහිර පාර්ශවයන්ට පවරා තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම් ලද පසු නියමිත ටෙන්ඩර් පරිපාටිය ක්‍රියාත්මක කරමි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) 1993 නොවැම්බර් 18 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සැලැසුම් අංක 15 චක්‍රලේඛයේ 2 ඡේදය | නාගරික සංවර්ධන අධිකාරියට අයත් සභාවේ පවතින බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.2,472,822 ක මුදල කිසිදු සංවර්ධන ව්‍යාපෘතියකට යොදවාගෙන නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවය මත සංවර්ධන කටයුතු සඳහා අරමුදල් යොදා ගැනීමට කටයුතු කරමි. | අදාල අරමුදල් ප්‍රාදේශීය සංවර්ධනයට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.59,242,057 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.64,769,012 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාතලේ ධර්මපාල මාවතේ පිහිටි වර්ග අඩි 11648ක් වූ මහල් හතරකින් සමන්විත වර්තමාන මහජන බැංකුව පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා , 2013 වර්ෂයේදී ලබාගත් තක්සේරු වටිනාකමක් මත වාර්ෂිකව රු.400 බැගින් වරිපනම් බදු මුදලක් අයකරමින් පැවතුණ ද, වර්තමාන තක්සේරු අගය මත වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තාක්ෂණික නිලධාරී වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරමි. | වර්ථමාන තක්සේරු වටිනාකම මත වරිපනම් බදු අයකිරීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | වරිපනම් ඒකකයක මුළු හිඟ මුදල රු.15,000ක් ඉක්මවූ පෞද්ගලික දේපල 335 කින් රු.10,169,957 ක හිඟ වරිපනම් බදු හා රාජ්‍ය ආයතන 43 කින් රු.3,900,045 ක හිඟ වරිපනම් බදු ශේෂයක්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2021 නොවැම්බර් 12 වන විට පිළිවෙළින් රු.6,695,597 ක් හා රු.3,837,103 ක් තව දුරටත් අයවිය යුතුව තිබුණි. | දීර්ඝ කාලීනව වරිපනම් බදු අයකර ගැනීමට නොහැකි පාර්ශවයන්ට නීතිමය කටයුතු සිදු කරමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.8,381,103 ක් හා මුද්දර ගාස්තු රු.29,210,210 ක් විය. 2021 නොවැම්බර් 11 දින වනවිට එකතුව රු.4,126,117 ක් තවදුරටත් අයවියයුතුව තිබුණි. | අයකර ගැනීමට ඉල්ලීම් ලිපි යොමුකර ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**2.3 අධිභාර**

---------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.536,781 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනයක් කර ඇත.. | අමාත්‍යාංශ ලේකම්ගේ තීරණ ලබාගෙන අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 අනාර්ථික ගනුදෙනු**

-----------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ නන්දිමිත්‍ර ඒකනායක ජාත්‍යන්තර හොකී ක්‍රීඩාංගනය භාවිතා කිරීම නතර කර තිබියදී මාසිකව රු.4,100 ක ස්ථාවර ගාස්තුවක් ලෙස 2015 වර්ෂයේ සිට 2020 අගෝස්තු දක්වා කාලය තුළ ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට රු.278,800 ක් ගෙවා තිබුණි. | ක්‍රීඩාංගනය මහා නගර සභාව වෙත නීත්‍යානුකූලව පැවරීමක් ගොනුව තුළින් සොයාගත නොහැකි . 2015 වර්ෂයේ සිට ක්‍රීඩාංගනය ක්‍රීඩා කටයුතු සඳහා යොදවා ඇත. | 2015 වර්ෂයේ සිට ක්‍රීඩා කටයුතු සිදුකළ බවට සාක්ෂි අනාවරණය නොවූ අතර, විදුලි ගාස්තු ගෙවීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

**3.2 හඳුනාගත් පාඩු**

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොංහාවෙල හා අඹගහමුල වෙළඳ සංකීර්ණවල කඩ කාමර 32 ක් බදුදීම සඳහා රු.230,502 ක් වැයකර 2020 ජනවාරි 13 දින පුවත්පත් දැන්වීම් පළකර තිබුණි. කඩ කාමරවලට අදාළ පැරණි තක්සේරුව 2019 මාර්තු 28 | නව තක්සේරුවක් ලැබී ඇති අතර, ඒ අනුව ගිවිසුම්ගත වී අදාළ කඩ | අවධානයෙන් හා නිසි සැලකිල්ලෙන් කටයුතු කළ යුතු වීම හා අලාභයන් |

| | | |
|---|---|---|
| දින සිට ඉදිරි වසර 3ක් සඳහා වලංගු වන බව දක්වා තිබියදී, එම තක්සේරු වාර්තාව වලංගු කාලය අවසන්ව ඇති බව දක්වා ටෙන්ඩර් අවලංගු කර නැවත තක්සේරු කර ටෙන්ඩර් කිරීමට තීරණය කර තිබුණි. මේ හේතුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා වැයකළ රු.230,502 ක මුදල සභා අරමුදලට අලාභයක් සිදුව තිබුණි. | කාමරවලින් බදු කුලී අයකර ගැනීමට කටයුතු කරමි.. | සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වීම. |

**3.3 දූෂණ අක්‍රමිකතා**

-------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව තාවකාලික, අනියම් (දෛනික) ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම යටතේ වර්ෂ 8 ත් 19 ත් අතර කාලයක සිට සේවයේ යෙදී සිට 2014 ඔක්තෝබර් 24 දින සේවය කළ තනතුරුවල ස්ථිර කර තිබුණු සේවකයින් 21 දෙනෙකු විසින් කූට ලේඛන පිළියෙල කර ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තිබුණි. | අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති සේවකයින් සඳහා පුහුණු පාඨමාලාවක් පවත්වා එමඟින් සුදුසුකම් ලබන සේවකයින් 8 ශ්‍රේණිය සමත් සේ සලකා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරමි. | අක්‍රමිකතාවයන් සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගැනීම නිසි කාලය තුළ සුදුසුකම් පරීක්ෂා කරවාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වීම. |
| (ආ) | මහා නගර සභා බලප්‍රදේශය තුළ තම පදිංචිය වසර 3 කට අධික කාලයක් පවතින බව දැක්වීම සඳහා පදිංචිය හා චරිතය පිළිබඳව ග්‍රාම නිලධාරිවරයා විසින් නිකුත් කළ බව සඳහන් කූට ලෙස සකස් කළ ව්‍යාජ පදිංචි සහතික ඉදිරිපත් කර තිබූ බලප්‍රදේශයෙන් පිට පදිංචිව සිටින පුද්ගලයින් හතර දෙනෙකු රියදුරු තනතුරු සඳහා බඳවාගෙන තිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර ලබාදී තිබුණු පත්වීම් බල රහිත කර ඇති අතර, පොලීසිය මඟින් විමර්ශනයක් ආරම්භ කර ඇති බව. | අක්‍රමිකතාවයන් සිදුකළ හා සිදුකිරීමට සහාය ලබාදී ඇති පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වීම. |

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 වර්ෂයේ ගිවිසුම්වලට එළඹ තිබූ කඩ කාමර 14 කින් එකතුව රු.3,389,297ක එක්වන් මුදලක් හා ඊට අදාලව ගණනය කර තිබුණු එකතුව රු.22,880,827 ක දඩ මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක්වන් මුදල් හා දඩ මුදල් නොගෙවන බදුකරුවන් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරමි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2018 වර්ෂයේ වාහන නැවතුම් ගාස්තු අයකිරීම සඳහා කොමිස් පදනමට බඳවා ගෙන තිබූ වාහන පාලකවරු 40 දෙනෙක් වෙනුවෙන් 2019 වර්ෂය සඳහා සභාවෙන් අයකර තිබූ | සේවකයින්ට ලබාදීමට කටයුතු කරමි. | සේවකයින්ට අදාළ මුදල් ආපසු ලබාදිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සේවක අර්ථසාධක අරමුදල් හා සේවකයින්ගේ දායක මුදල් රු.762,615 ක් 2020 අගෝස්තු 18 දින වන විටත්, පොදු තැන්පත්වල රඳවාගෙන තිබුණි. මේ වන විට එම සේවකයින්ගේ සේවාව අවසන් කර තිබියදී එම මුදල් ඔවුන්ට ආපසු ලබාදීමට හෝ කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | සභාවට අයත්, සැක්සන් පාර්ක් නැමැති ඉඩම් කොටස 1996 මැයි 29 දින සිට දීර්ඝ කාලීන බදු පදනමට ලබාදී තිබුණි. 2011 අප්‍රේල් 01 දිනෙන් පසුව ගිවිසුම් අලුත් කරවාගෙන නොතිබූ අතර, අදාළ ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනීමට හෝ කටයුතු කිරීමකින් තොරව ඉඩම අනවසරයෙන් පරිහරණයට ඉඩකඩ ලබාදී තිබුණි. 2016 අප්‍රේල් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා කාලයට අදාළ රු.135,000 ක බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2016 මාර්තු 31 දිනෙන් ආරම්භ වන වර්ෂ 05 සඳහා අදාළ භූමිය බදුදීම සඳහා මේ දක්වා නව තක්සේරු වාර්තා ද ලබාගෙන නොතිබුණි. | තක්සේරු වාර්තා ලබාදෙන ලෙස ප්‍රධාන තක්සේරුකරු වෙත ලිපි යවා ඇත. ජනාධිපතිතුමාගේ ලිඛිත අවසරය ලබා ගැනීමට කටයුතු කරමි. | තක්සේරු වාර්තා ලබාගෙන ගිවිසුම් අළුත්කර නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ගොංහාවෙල නව බස් නැවතුම්පලේ පෞද්ගලික බස් රථවලින් රු.100 ක දෛනික ගාස්තුවක් අය කිරීමට මහා සභාව තීරණය කර තිබුණ ද, 2020 අගෝස්තු 17 දින වන විටත් එම තීරණය ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2020 මැයි සිට අගෝස්තු මාසය දක්වා කාලය තුළ පමණක් දළ වශයෙන් බස් රථවලින් මහා නගර සභාවට අයකර ගැනීමට තිබුණු රු.1,291,500 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. | වාහන පාලකවරුන්ගේ පත්වීම් අවලංගු කිරීම නිසා ගාස්තු අයකිරීම නිසි ලෙස කිරීමට නොහැකි විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | අනවසරයෙන් ඉදිකර පදිංචි වී හා ව්‍යාපාරික කටයුතු සිදුකරන ගොඩනැගිලි දෙකක් සම්බන්ධව සමාලෝචිත වර්ෂයේ දී ආදායම් පරීක්ෂකවරුන් වාර්තා කර, අනුකූලතා සහතික ලබා නොගැනීම සම්බන්ධව දිනකට රු.250 ක දඩ මුදලක් අයකර ගැනීමට නිර්දේශ කර තිබුණද, ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | අදාළ ගොඩනැඟිලි අනවසර ඉදිකිරීමක් සේ සලකා ඉදිරියේදී කටයුතු කරමි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වීම. |
| (ඊ) | අවස්ථා 32කට අදාළ කඩ කාමරවලින් ලැබී තිබුණු එක්වන් මුදල් හා පැවරුම් ගාස්තු අයකිරීම් රු.1,866,234 ක් ආදායමට ගැනීමකින් තොරව දීර්ඝ කාලයක සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | වාරියපොලවත්ත කසළ භූමියෙන් ගලා බසින අපජලය වැසි දිනවලදී ඒ අසලින් ගලා බසින සුදු ගඟට එකතුවීම පාලනය කර නොතිබුණි. වාරියපොල වත්ත කසළ බැහැර ඉඩමට කසළ බැහැර කිරීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවැති අතර, නඩු ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට රු.5,639,975 ක් වැයකර තිබුණි. එසේම අදාළ ඉඩම මිලදීගෙන නොතිබූ අතර පරිසර ආරක්ෂණ බලපත්‍රය ද ලබාගෙන නොතිබුණි. | ඉඩම මිලදී ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින අතර, අනිකුත් කාර්යයන් සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ගයන් ගනිමි. | පාරිසරික හානිය අවම කර නිසි කසළ කළමනාකරණයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඌ) | නගරාධිපතිවරයාගේ භාවිතය සඳහා රු.10,975,000 ක් වැයකර 2019 වර්ෂයේ මිලදීගෙන තිබූ කැබ් රථයේ ඉන්ධන දහනය ලීටර් 01 කට කිලෝමීටර් 09 ක් ධාවනය කළ හැකි බවට ඉංජිනේරුමය සහතික ලබාගෙන තිබුණ ද, අදාළ කැබ් රථයේ ධාවන සටහන්වලට අනුව ඉන්ධන ලීටර් 01 කින් කිලෝමීටර් 5.26 සිට 7.17 ක් වූ පරාසයක් තුළ ධාවනය වන බව දක්වා 2019 දෙසැම්බර් 19 දින සිට පරීක්ෂණයට භාජනය වූ 2020 ජූනි 30 දක්වා කාලය තුළ කිලෝමීටර් 15740 ක් ධාවනය කර ඉන්ධන ලීටර 869 ක් සඳහා රු.114,708 ක් වැඩියෙන් වැය කර තිබුණි. | අවභාවිතා කරන ලද ඉන්ධනවලට අදාළ මුදල අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරමි. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විහාර පාරට සමාන්තර අඹගහමුල බස් නැවතුම්පල මැද පිහිටි පැරණි වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ එකතුව වර්ග අඩි 776 ක කඩ කාමර 5 ක් වසා දමා තිබුණි. එම වෙළඳ සංකීර්ණයේ අංක 30 කඩ කාමරයේ හිමිකරු වර්ග අඩි 161 ක කොටසක් අනවසරයෙන් ඉදිකර තිබූ අතර, වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ අංක 01 කඩ කාමරය හා පියගැටපෙළ අතර වූ වර්ග අඩි 63 ක හිස් කොටසේ අනවසරයෙන් වෙළඳ කුටියක් පවත්වාගෙන ගොස් තිබුණි. | ඉදිරියේදී මෙම සියළු අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරමි. | දේපලවල ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කුඹියන්ගොඩ ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගයට යාබදව පැවති අනවසර ඉදිකිරීම් දෙකක් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | ඉදිකිරීම අනවසර ඉදිකිරීමක් සේ සලකා කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක සිට වසා දමා ඇති කඩ කාමර 32 ක් හා කිරිහල් 2 ක් බදුදීම සඳහා රු.230,502 ක් වැයකර 2020 ජනවාරි 16 දින මිල ගණන් කැඳවා තිබුණු අතර කඩ කාමර 4 ක් හා එක් කිරිහලක් සඳහා මිල ගණන් ලැබී තිබුණි. මේ සඳහා 2020 පෙබරවාරි 18 දින ටෙන්ඩර් තීරණ ලබා දීමෙන් පසුව කඩ කාමර පවරාදීමට හැකියාව තිබියදී 2020 අගෝස්තු 31 දින වන විටත්, ගිවිසුම්වලට එළඹ බදුදීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2020 මාර්තු 01 සිට 2020 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදයට පමණක් අවම වශයෙන් රු.1,145,500 ක ආදායමක් ලබා ගැනීමට තිබූ හැකියාව අහිමි කරගෙන තිබුණි. | පැරණි තක්සේරුවට අනුව හිඟ මුදල් අයකර ගැනීමටත් නව තක්සේරුවට අනුව කඩ කාමරවලින් බදු කුලී අයකිරීමටත් කටයුතු කරමි. | විධිමත් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර කඩිනමින් බදුකරුවන් තෝරාගෙන නියමිත කාලය තුළ ගිවිසුම්වලට එළඹ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | භාණ්ඩ මිලදී ගැනීමේදී මහා නගර සහා සම්මත අතුරු ව්‍යවස්ථාවේ V කොටසේ II(ඇ) ප්‍රකාරව ලැබී තිබූ අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩි මිල ගණන් යටතේ මිලදී ගැනීමේදී ඊට හේතු දක්වා නිර්දේශ ඉදිරිපත් කළයුතුය. එසේ වුවද පරීක්ෂණයට භාජනය වූ මිලදී ගැනීම් අවස්ථා 6 ක අවම මිල ගණන් යටතේ භාණ්ඩ මිලදී ගැනීමට හේතු නොදක්වා රු.517,578 ක භාණ්ඩ වැඩි මිල ගණන් යටතේ මිලදීගෙන තිබූ අතර, ඒ අනුව අවම මිල ගණන් ඉක්මවා ගෙවා තිබුණු මුදල රු.149,472 ක් විය. | මේ සම්බන්ධයෙන් මුදල් කාරක සභාව හා මහා සභාව දැනුවත් කිරීමටත්, අදාල තොරතුරු හා හේතු පැහැදිළි කිරීම් සඳහන් කිරීමටත් ඉදිරියේදී කටයුතු කරමි. | අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුස්තකාල සේවා මණ්ඩලයේ නිර්දේශයන්ට අනුව තුන්වන ශ්‍රේණියේ පුස්තකාලයක් ලෙස පවත්වා ගැනීමට සුදුසු කිසිදු පහසුකමක් නොමැතිව තමගාවා නිවාඩු නිකේතන ගොඩනැගිල්ලේ කාමර දෙකක පුස්තකාලය පවත්වාගෙන ගොස් ඇති බැවින් සුදුසු පුස්තකාලයක අවශ්‍යතාවය තිබියදී ඒ කෙරෙහි අවධානය යොමු නොකර රු.3,402,397 ක් වැයකර ප්‍රමිතියකින් තොර කියවීම් ශාලාවක් ඉදිකර තිබුණි. මේ සඳහා ශක්‍යතා අධ්‍යනයක් ද සිදුකර නොතිබුණි. | හිටපු නාගරික ඉංජිනේරුගේ හා හිටපු නගරාධිපතිගේ උපදෙස් අනුව කටයුතු කර ඇත. | අවශ්‍යතාවය හඳුනාගෙන නිසි පරිදි සැලසුම්කර සක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුල්ලෙයාර් කෝවිල් පාරේ පැති කාණුව ජලය බැස යන ආනතිය නිසි පරිදි හඳුනාගෙන සැලසුම් කර මීටර් 470 ක් දුරට කොන්ක්‍රීට් යොදා නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් පවරා 2020 ජූලි 22 වන දින වන විට පළමු කොටස් මුදල් ලෙස රු.1,287,279 ක් ගෙවා තිබුණි. ඉදිකිරීම් කරන අතරතුර පැති කාණුවේ ආරම්භයේ සිට මීටර් 100 ක් පමණ දුරින් වූ ප්‍රදේශයේ පොළවේ පිහිටීම ආරම්භක කොටසට වඩා උස මට්ටමක පවතින බව හා ජලය ගලායාම නියමිත පරිදි සිදු නොවන බව හඳුනාගෙන තිබුණි.ඒ හේතුවෙන් 2020 සැප්තැම්බර් 24 පරීක්ෂණ දින වන විට ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා ඇති බව නිරීක්ෂණය විය. | මහජන විරෝධයන් මත වැඩ කටයුතු නැවත්වීමට සිදුවිය. | නිසි අධ්‍යයනයකින් පසුව තාක්ෂණික ඇගයීමක් සිදුකර අවශ්‍යතාවය අනුව ව්‍යාපෘති සැළසුම් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | අඹගහමුල බස්නැවතුම්පලෙහි බිම් මහලෙහි හා පළමු මහලෙහි පිහිටි කඩ කාමර 29 න් කඩ කාමර 22 ක් වසර 18 ක කාලයක සිට වසා දමා නිෂ්ක්‍රීයව විනාශ වීමට ඉඩහැර තිබියදී අවශ්‍යතාවය නිශ්චිතව හඳුනානොගෙන හා සක්‍යතා අධ්‍යයනයකින් තොරව රු.10,794,600 ක් වැයකර දෙවැනි මහල ඉදිකර තිබුණි. පළමු මහලේ බිත්ති හා තලාද (Beam) පුපුරා ඉරිතලා ගොස් ගොඩනැඟිල්ල අස්ථාවර මට්ටමක තිබියදී ඒ මත දෙවැනි මහල ගොඩනැගිලි සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව ඉදිකර තිබුණි. ඉදිකර තිබුණු දෙවන මහල මත වූ ගොඩනැඟිල්ලේ වහල නිසි ප්‍රමිතියකින් ඉදිකර නොතිබුණු අතර, අළුතින් ඉදිකර ඇති ගොඩනැඟිලි කොටසේ එක් පේළියකට කොන්ක්‍රීට් කුළුණු 03 ක් ලෙසට පේළි 19 ක් සඳහා කුළුණු 57 ක් ඉදිකිරීමට ඇස්තමේන්තු සකස්කර තිබුණද, ඉදිකිරීමේදී එක් පේළියකට කුළුණු 2 බැගින් පේළි 18 ක් සඳහා කුළුණු 36 ක් ඉදිකර තිබුණි. මේ අනුව ඇස්තමේන්තු සකස් කිරීම අවිධිමත්ව කර ඇති බව නිරීක්ෂණය විය. | උපකාරක පන්ති වැනි කාර්යයන් සඳහා යොදවා ගැනීමට හිටපු නගරාධිපතිගේ උපදෙස් අනුව කටයුතු කර ඇති අතර, සැළසුම් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරියේදී ඉදිරිපත් කරමි. | අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන සක්‍යතා අධ්‍යයනයකින් පසුව යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |